SJSW 2023 3(1) : 01-08

Student Journal of Social Work (SJSW)
Volume 03 – Issue 01

# THE PSYCHOLOGICAL STRUGGLES OF WOMEN REVEALED IN THE PLAY *MANAME*: A COMPARATIVE INVESTIGATION

**Sureshwara.C.S.1** [1]

[1] School of Social Work, National Institute of Social Development, Liyanagemulla, Seeduwa, Sri Lanka

## ABSTRACT

The play *Maname* is a creation that showcases the prominent features of Sri Lankan theater. The female traits portrayed by the princess in *Maname* reflect characteristics common to Asian women. Notably, the role of the princess in *Maname* represents her mental state as being in a schizophrenic condition. This paper explores the psychological schizophrenic state faced by women and the factors influencing it.

**KEYWORDS:** Mental Conflict, Masculinism, Male-Centric, Maname Play

**හැඳින්වීම**

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාටකය වනාහි මුලු නාට්‍ය ක්ෂේත්‍රය වෙනස් මගකට යොමු කළ නිර්මාණයක් විය. සරච්චන්ද්‍රයන්ගේ ස්වතන්ත්‍ර නිර්මාණ අතරින් ඉහළින් ම අවධානය යොමු වන නාට්‍ය යැයි මෙය හැඳින්වීම වරදක් නොවේ. මනමේ නාටකය බිහි වන්නේ ඉංගිරිසි නාට්‍ය කලාවට විකල්ප නාට්‍ය සම්ප්‍රදායක් සොයා යෑමේ ප්‍රතිඵලයක් වසයෙනි. සරච්චන්ද්‍රයන්ට පූර්වයේ හා සමකාලීන ව නාට්‍යකරණයේ නියැලුණු ඊ. ඇෆ්. සී. ලුඩොවොයික්, නියුමාන් ජුබාල් ආදී කිසිවෙකුටත් ලෝකප්‍රකට නාට්‍යන්හි ඉංග්‍රීසි නව නිෂ්පාදන හා සිංහල පරිවර්තන රංගකෘත කිරීමට විනා දේශීය නාට්‍ය කලාවක් ප්‍රතිෂ්ඨාපනය කිරීමට අවකාශ නොලැබුණි. සරච්චන්ද්‍රයන්ගේ දායක වීමෙන් නිෂ්පාදනය වුණු මුදලාලිගේ පෙරළිය (1943), හැංගිහොරා (1949), බහින කලාව (1951), වෙදහටන (1953) වන් නාට්‍ය නිර්මාණයන්ගෙනුදු දේශීය නාට්‍ය කලාවේ මං සලකුණු විද්‍යමාන නොවුණු සෙයින් දෝ ඒ කිසිදු නිර්මාණයක් ජයමාන්න නාට්‍ය තරමින් වත් මෙරට හුදු රසිකයා පිනවීමට සමත් වූයේ නැත. බටහිර අධ්‍යාපනය විසින් ම හික්මවන ලද අනෙකුත් නාට්‍යෝපදේශක ආචාර්යවරුන් කෙසේ අදහස් කළ ද සිංහල රසිකයා පිනවීමට හා සම්භාව්‍ය දේශීය නාට්‍ය සම්ප්‍රදායයක් බිහි කිරීමට නම් ජන නාට්‍යයන්හි ලක්ෂණ රැගත් සිංහලයාගේ ගැමි සුවඳ ම කැටි වුණු නාට්‍ය ශෛලීන් උපයෝගී කරගත යුතු යී යන අවබෝධය සරච්චන්ද්‍ර සතු ව පැවැතුණි. දේශීයයන්ගේ ජන විඥ්ඥාණය පසක් කොට ගෙන තිබුණු ඔහු ශාන්ති නිකේතනය වන් ආයතනවලින් ද පෙරදිග සම්ප්‍රදායය හදාරා තිබිණ. තම අධිෂ්ඨානය තව දුරටත් දැඩි වන්නට ඔහු ලියූ ‘The folk drama of Ceylon’ වන් ගවේෂණාත්මක කෘති ද හේතු වුණි. (ඉන්දික සම්පත්, බිහේෂ්. මනමේ විමසුම, 2016; 8, 9).

සිංහල සංස්කෘතියට ඔබින නාට්‍යයක් නිර්මාණය කිරීමට නම් මහ සංස්කෘතියට සමීප වන මාතෘකාවක් පාදක කරගත යුතුයි. මනමේ නාට්‍ය නිෂ්පාදනය කිරීමට පෙර සිට ම ඒ සඳහා විවිධ උත්සාහ දරා ඇත්තේ සරච්චන්ද්‍රයන් ඒ කරුණ හොඳින් වටහාගත් හෙයිනි.

මේ හේතුව නිසා සරච්චන්ද්‍රයෝ පර්යේෂණයක නියැලුණහ. දිගු කාලයක් තිස්සේ ගමක් පාසා ගොස් ගැමි සංස්කෘතියේ වූ විවිධ අභිචාරාංග පිළිබඳව සොයා බැලුවේ ය. ඒ පිළිබඳව පුළුල් වූ අධ්‍යයන කාර්යයේ යෙදුණේ ය. ඒ කැපවීමේ විපුල ඵල ලැබෙන්නට වූයේ සරච්චන්ද්‍රයන් 1952 වසරේ දී පේරාදෙණි විශ්වවිද්‍යාලයට පැමිණීමත් සමගින් ය. මේ පර්යේෂණයේ අග්‍රඵලය වූයේ ‘The Sinhalese folk Play’ නම් පර්යේෂණ නිබන්ධනය 1953 වසරේ දී එළිදැක්වීමයි.‘සිංහල ගැමි නාටකයී වසයෙන් 1958 දී සිංහලයට නගා ප්‍රසිද්ධ කළේ ද ඒ පර්යේෂණ නිබන්ධනය යි.

කුරුණෑගල යුගයේ රචනා වී ඇති පන්සියපනස් ජාතක පොතේ 368 වැනි කතාව වන චුල්ල ධනුද්ධර ජාතක කතාව මනමේ නාටකය සඳහා මූලාශ්‍ර වී ඇත. එහෙත් මනමේ නාට්‍යයට වෙනත් මූලාශ්‍ර ද බලපා ඇති බවක් නාට්‍ය විමැසීමේ දී සදෘශ්‍යමාන වේ. චුල්ලධනුද්ධර ජාතකය ආශ්‍රයෙන් සරච්චන්ද්‍රයන් මනමේ නාටකය බිහි කිරීමට මත්තෙන් ගැමි කලාකරුවා ද ඒ ඔස්සේ නාට්‍ය නිර්මාණ කිහිපයක් බිහි කර තිබුණි. මනමේ කෝලම, මනමේ කවි නාඩගම ඒ අතර ප්‍රධාන ය. එසේ ම මෙකී කථාන්දරය ජන කථාවක් වශයෙන් ද ගැමියන් අතර ප්‍රචලිත ව තිබුණි. (ඉන්දික සම්පත්, බිහේෂ්. මනමේ විමසුම, 2016; 15). මහාචාර්ය බිහේෂ් ඉන්දික පවසන අයුරින් තහවුරු වන්නේ මහැදුරු සරච්චන්ද්‍රයන්ට තම නාට්‍යය නිර්මාණය කිරීමට ජාතක කතාව මෙන් ම ගැමි නාට්‍යකරුවන් නිර්මාණය කළ මනමේ කෝලම හා මනමේ කවි නාඩගම ද බලපා ඇති බවයි.

මේ මූලාශ්‍රවලට අමතරව ජපන් ජාතික අකුතගව රියුනොසුකගේ ‘යබුනො නකී (වන ලැහැබක දී) කෙටිකතාව ඇසුරින් ජපන් ජාතික අකිරකුරොසව නිර්මාණය කළ ‘රෂොමනී

චිත්‍රපටයේ සෙවණැල්ලක් ද වැටී ඇති බවට පෙනේ. එහෙත් අත්තනායක එම්. හේරත් සූරීන් පවසන පරිදි මනමේ නාට්‍යයේ රෂොමන් හි තරම් සංකීර්ණ ගැටුමක් දක්නට නොහේ. මෙම රෂොමොන් කෘතියට සාපේක්ෂ ව බැලූ කල මනමේ හි ගැටුම එතරම් සංකීර්ණ ගැටුමක් නො වේ. එසේ ම මනමේ නාටකයේ දී රෂොමොන්හි පමණට සත්‍ය අවිනිශ්චිත ව තැබීමක් ද නොපෙනේ. (හේරත්, අත්තනායක එම්. සිංහබාහු හා මනමේ විවරණය, 1991; 20). රෂොමන් හි කථා සාරය ගෙන බැලූ විට එහි ඇත්තේ මානසික ගැටුම ගැඹුරින් විවරණය කිරීමයි. එහෙත් මනමේ නාට්‍යයේ ඇත්තේ ජාතක කතාතරුවාට වඩා වෙනස් අයුරකින් මිනිස් හැසිරීම් හා කාන්තා සිත පිළිබඳව දැක්වීමයි.

**සංවාදය**

ජාතක කතාව ප්‍රධාන මූලාශ්‍රය වූවත් එහි ඇති මනෝවිද්‍යාත්මක පසුබිමට වඩා වෙනත් මානයකින් සරච්චන්ද්‍ර සූරීහු තම මනමේ නාට්‍යය නිර්මාණය කළහ. චිරන්තන සාහිත්‍යකරුවන්ට බ්‍රාහ්මණ දෘෂ්ටිය බලපා ඇති බැව් ඔවුනගේ සාහිත්‍ය පිරික්සීමේ දී පෙනේ. ඒ නිසා බොහෝ සාහිත්‍ය කෘතිවල කාන්තාව පිළිබඳව දක්වා ඇත්තේ අවමාන ස්වරූපයෙනි. එහෙත් ජාතක කතාකරු වැන්නවුන් ඒ මග අතහැර දැමූ බැව් බෞද්ධ සාහිත්‍ය විමසීමේ දී පෙනේ. මේ මාතු ගාමයෝ වූ කලි පව්ටු සිත් ඇති සත්ත්ව කෙනෙකී යන චිරන්තන බ්‍රාහ්මණ යති දෘෂ්ටිය සෑම ජාතක කථාවකින් ම විද්‍යමාන නො වේ. අසාතමන්ත ජාතකය, අන්ධභූත ජාතකය යනාදියෙහි දී ද ස්ත්‍රී චපලත්වය දැක්වීමටත් වඩා තත්ප්‍රකෘතික මනුෂ්‍ය චිත්ත චෛතසිකයන් විග්‍රහ කරලීම ජාතක කථාකරුවා ගේ අභිප්‍රායය වූ බැව් පෙනේ. චන්දකින්නර, වෙස්සන්තර වන් ජාතකයන්ගෙන් දැක්වෙනුයේ උත්තරීතර ස්ත්‍රීන් පිළිබඳවයි. (ඉන්දික සම්පත්, බිහේෂ්. මනමේ විමසුම, 2016; 27). මහාචාර්ය බිහේෂ් ඉන්දික වැඩි දුරටත් දක්වන්නේ ජාතකකරුවාගේ ජීවන දෘෂ්ටිය එක් එක් ජාතක කතා ඇසුරින් වෙන වෙන ම අධ්‍යයනය නොකළ හැකි බවයි. මේ හා සමාන අදහසක් ජැක්සන් ඇන්තනී ද තම කෘතියේ දී දක්වන්නේ ය. ජාතක සංග්‍රහයේ ම සමහර කථාවලින් ස්ත්‍රියට ගෞරව දක්වා ඇත. සම්බුලා ජාතකයේ එන සම්බුලාව, මණිචෝර ජාතකයේ එන සුජාතාව සහ අනනුසෝචිය ජාතකයේ එන සම්මිල්ලවාහිණිය නොමඳ ගෞරවාදරයට පාත්‍ර කොට නිර්මාණය කරන ලද කාන්තා චරිතයෝ ය. නමුත් මේ චරිත අපේ සම්ප්‍රදායට ඍජු ලෙස ම බලපා නැත. ඊට වඩා වැඩි ප්‍රතිශතයකින් කාන්තා නුගුණ කී සාහිත්‍යාංග සම්ප්‍රදාය ගලා ගොස් ඇත. (ඇන්තනි, ජැක්සන්. එබැවින් බිහිවිය මනමෙ,1998; 91).

මනමේ නාට්‍යයේ නිරූපිත එක ම ස්ත්‍රී චරිතය වන්නේ මනමේ කුමරියගේ චරිතයයි. එම චරිතය ජාතක කතාවට වඩා වෙනස් ආකාරයකින් දැක්වීමට සරච්චන්ද්‍රයෝ උත්සාහ කළහ. එහෙත් මගේ අදහස වූයේ බිසව අහිංසක ස්ත්‍රියක ලෙස නිරූපණය කිරීම ය. (සරච්චන්ද්‍ර, එදිරිවීර. මනමේ නාටකය, 2006; 16). සරච්චන්ද්‍රයන් එහි දී දක්වන්නේ නිර්මාණකරුවෙකු ලෙසින් තම අදහසයි. එහෙත් නාටකය ආරම්භයේ පටන් ම විචාර බුද්ධියෙන් පිරික්සන්නෙකුට මනමේ කුමරියගේ මානසික ගැටුම ඉස්මතුව පෙනේ.

නාට්‍යයේ දී වැදගත් කරුණක් හුවා දැක්වීමට නාට්‍යකරු උත්සාහ දැරුවේ ය. එනම් පුරුෂ මූලික ආකල්පයයි. මේ පුරුෂෝත්තමවාදය නාට්‍යයේ ආරම්භයේ පටන් ම ප්‍රේක්ෂකයාට දක්නට ලැබේ. පුරුෂෝත්තමවාදී දෘෂ්ටිකෝණය එදිරිවීර සරච්චන්ද්‍රයන් තම නාට්‍යයේ දක්වන්නේ සියුම් ආකාරයෙනි. මේ තත්ත්වය සහෘදයාට ඒත්තු ගන්වන්නේ බ්‍රාහ්මණ මතවාදයි. ස්ත්‍රිය කුමාරි කාලයෙහි තම පියාගේ ද භාරයා සමයෙහි සිය සැමියාගේ ද මහලු අවධියෙහි තම පුතුන්ගේ ද ආධිපත්‍යය යටගේ සුවච ව, කීකරු ව, පා පිස්නා බිස්සක් සේ මන් නැති ව කල් ගෙවිය යුතු ය යනු නිල ඒකභාර්යා ව්‍රතයෙන් යුතු පුරුෂෝත්තමවාදී සමාජයෙහි චිරාගත ශික්ෂාවකි. (ගම්ලත්, සුචරිත. මනමේ නාට්‍ය සේවනය, 1996; 89). ඒ හේතුවෙන් කාන්තාවගේ ස්වාධීනත්වය පුරුෂයා විසින් අහෝසි කෙරේ. මෙසේ පුරුෂ මූලික

සමාජයක දී කාන්තාවගේ මානසිකත්වය වෙනස් වන්නේ ඇයටත් නොදැනීය. තමන්ට අවැසි දේ සිදු කර ගැනීමට ඈ එවන් අවස්ථාවන්හි උත්සාහ දරන්නීය.

නාට්‍යය ආරම්භයේ පටන් ම කුමරියගේ මානසික ගැටුම ඉස්මතු කිරීමට සරච්චන්ද්‍රයෝ උත්සාහ දරති. මනමේ කුමරාට, කුමරිය විවාහ කර දීමට සැරසෙන අවස්ථාවේ පටන් ම ඇය හැසිරෙන්නේ මානසික පීඩනයකින් බවට හැඟේ.

**රාජගුරු - වචනය**

මා සිත් ගත් කුමාරයාණනි, ඔබ හට මාගේ ආදරය පැවසීම සඳහා මාගේ නේත්‍රය මෙන් රක්ෂා කළ මා දියණිය ඔබට සරණ පාවා දෙන්ට අදහස් කරමි. ඔබ මේ විවාහයට සතුටු දැයි දැන ගනු කැමැත්තෙමි.

මීට පිළිතුරු වසයෙන් මනමේ කුමරිය මෙසේ කියන්නීය.

**කුමරි - සින්දුව**

කතුන් ලොව තුලා - රසඳුන් නයනාලේප කරන

මේ කුමරුන් හට වන්නට පියඹ

සන්තෝස වේ ද සිත් අසනු කුමට

කුමරිය මෙහි දී ගන්නා තීරණය ස්වාධීන නොවන බවක් පෙනේ. ඊට හේතු සඳහන් විමසූ විට කරුණු කිහිපයක් ඉස්මතු වේ. පෙරදිග රටවල ඇත්තේ පුරුෂ මූලික සමාජයකි. ඒ නිසා තීරණ ගැනීමේ දී කාන්තාවට වැදගත්තැනක් නොලැබෙයි. තමන්ගේ පියාගේ වචනයට පිටින් යාමට දියණියට හැකියාවක් නොමැත. එවන් අවස්ථාවල දී කාන්තාවට ඇති වන්නේ මානසික පීඩනයකි. තමන්ගේ අදහස් නොවිමසා පියාගේ කැමැත්තට ක්‍රියා කිරීම හේතුවෙන් අවසානයේ දී කුමරිය එසේ ප්‍රකාශ කරයි. සරච්චන්ද්‍රයෝ එය තහවුරු වන අවස්ථාවක් නාට්‍යාරම්භයේදී ම සඳහන් කරති.

**කුමරි සිංදුව**

ලප නොම වන් සඳ සේ සොමි ගුණෙනා - ආදර දීනනා සිසු සැවොමා

රාජගුරුන්ගේ යුත් නැණ බෙලෙනා - වෙමි මම සුවචා දූ කුමරී

නිමල පෙමින් නිති මා ඇති දැඩි කළ - මා පිය ගුරුගේ අණ ලෙසිනා

සේ සිය නේත්‍රා මා රැකි සතතා - සිත නොම රිදවා වෙසෙමි සදා.

තම පියාගේ සිත නොරිදවීමට කුමරිය උත්සාහ දරන්නේ පිය සෙනෙහෙ නිසා ය. එහෙත් එහි දී සිදු වන්නේ කාන්තාව මානසික ගැටුමකට ලක් වීමයි. ඒ පිළිබඳව පුරුෂයින්ට නොදැනෙන්නේ ඔවුන්ට සංස්කෘතියෙන් පවරා දුන් පුරුෂ මූලික ආකල්පය හේතුවෙනි. ගම්ලතුන් දක්වන්නේ ස්ත්‍රිය පුරුෂයාගේ කාම සම්භෝගයත්, පරිභෝජනයත්, සේවයත් සඳහා පමණක් බවත් මුළු මහත් කයින්, වචනයෙන් හා මනැසින් සපුරාම යටත් බවත්ය. මේ චිරකාලීන සත්‍යය මනමේ නාට්‍යයෙන් ප්‍රකාශිත බව ගම්ලත්හු එහි දී දක්වති. ඔහු සඳහන් කරන මනැසින් යටත් බව මනමේ නාට්‍යයේ අපූරුවට දිග හැරේ.

මනැසින් යටත් වීම මෙහි වැදගත් කරුණයි. සිත නොම රිදවා වෙසෙමි සදා මනමේ කුමරිය නාට්‍යාරම්භයේ දී ප්‍රකාශ කරන දෙබස ප්‍රේක්ෂකයින්ගේ රස වින්දනය තියුණු කරයි. ඉන් ඇයට තම සිතැඟි අනුව කටයුතු කිරීමට අවස්ථාවක් නොමැති බව ඉන් ගම්‍ය වේ. වෙමි මම සුවචා දූ කුමරීයන පාඨයට අනුව කුමරිය තම පියාගේ සුවච දියණිය වන්නී ය. සුවච බැවින් තම පියාගේ සිත නොරිදා ඕ තොමෝ කටයුතු කරන්නී ය. එහෙත් ඇයගේ චිත්තාභ්‍යන්තරයේ තිබෙන්න පීඩනය ලොවට නොපෙනේ. කාට වුව ද තම මානසික පීඩාවන්

දරා ගත හැකි උපරිම සීමාවක් ඇත. අවසානයේ යම් අවස්ථාවක දී ඒ පීඩනය පුපුරා යයි. මනමේ කුමරිය පළමු ව සිය පිය රාජගුරුගේ ද අනතුරු ව සැමි මනමේ කුමරුගේ ද සිතැඟි අනුව පැවති තාක් කල් මතු පිටින් බලන විට ඇගේ ජීවිතය සෙමින් නිසල ව ගලා යමින් පැවති සෙයක් පෙනිණි. ඇගේ චිත්තාභ්‍යන්තරයේ කවර කුණාටු, සුළි සුළං පැවතුණත් පුරුෂයින්ට ඒවායින් කම් කිම්? (ගම්ලත්, සුචරිත. මනමේ නාට්‍ය සේවනය, 1996; 90). ගම්ලතුන් මෙහි සඳහන් කරන පරිදි කාන්තාවගේ චිත්තාභ්‍යාන්තරය කුණාටුවක් හා සමානය. ඊට හේතුව වන්නේ ස්වාධීන චින්තනය මඬුවන ලද කාන්තාවට ඉන් ඇති වන්නා වූ කැලඹීමයි. මෙය සමාජයේ එක් සත්‍යයක් මූර්තිමත් කරනු ලබයි.

මනමේ කුමරියගේ මානසික ගැටුම පුපුරා යන අවස්ථාව වන්නේ කුමරුගේ හා වැදි රජුගේ සටනින් පසුව ඇති වන සිද්ධියේදී ය. මෙතුවක් කාලයක් පුරාවට ඇයට රැකවරණය සැලසූ මනමේ කුමරුව ඝාතනය කර වැදි රජු සටන ජයග්‍රහණය කරයි. එවේලේ සිදු වූ සිද්ධිය නාට්‍යයේ උච්චතම අවස්ථාවද වෙයි. මේ අවස්ථාවේදී ය කුමරිය තම අදහස් අනුව ස්වාධීනව කටයුතු කරන්නේ. එසේ නම් ඇය මෙතුවක් කාලයක් ගත කර ඇත්තේ මානසික ගැටුමකින් යුතුවය. ස්ත්‍රී පීඩනය හමුවේ ඇයගේ මානසික දෙදරායාම මහැදුරු සරච්චන්ද්‍රයන් දකින්නේ මිනිසුන්ට සිදු විය හැකි අනපේක්ෂිත අභාග්‍ය සම්පන්න සිදුවීමක් ලෙසිනි. මනුෂ්‍ය ලෝකයෙහි මෙවැනි අභාග්‍ය ඉරණමක් කෙනෙකුට අත් විය හැකි බව දැන්වීමය මගේ අදහස වූයේ. එනම් ජීවිතයෙහි අනිත්‍යය මෙනෙහි කිරීමට ප්‍රේක්ෂකයාට තුඩු දීමයීය. (සරච්චන්ද්‍ර, එදිරිවී. මනමේ නාටකය, 2006; 16).

කාන්තාවගේ මානසික ගැටුම පිළිබඳව එදිරිවීර සරච්චන්ද්‍ර තම අවධානය නිරන්තරයෙන් යොමු කරයි. සරච්චන්ද්‍රයන් නිර්මාණය කළ සිංහබාහු නාට්‍යයේ සුප්පා දේවියගේ චරිතය ද මානසික ගැටුම මනාව ඉස්මතු කරන්නකි. ස්ත්‍රියට ආවේණික ලාලිත්‍යයකින් යුතුව සුප්පා දේවියගේ චරිතය ද නිමැවීමට හේ තෙමේ සමත් වූයේ ය. එහෙත් මනමේ නාටකයේ මෙන් ස්ත්‍රී මානසික ගැටුම අනවරතයෙන් දිග නොහැරේ. තම වල්ලභයා වූ සිංහයාව අතැර දමා ලෙනෙන් පිටවීම නිසා ඕ තොමෝ මානසික ගැටුමකට පත්වූවාය.

සිංහබාහු නාටකයේ වස්තුව විකාශනය වන්නේ එහි පාත්‍රයන්, නිදහස් පුද්ගලයන් සේ සිතා මතා කරන ක්‍රියාවල අනිවාර්ය ප්‍රතිඵල වශයෙනි. එහෙත් මා විසින් පෙර රචිත මනමේ නාටකයේ සිදුවන දෙයට පාත්‍රයන් එම ප්‍රමාණයට වග කිව යුත්තන් නොවන බව ප්‍රේක්ෂකයන්ට පෙනෙනු ඇතැයි හඟිමි. මනමේ නාටකයේ පාත්‍රයන් කිසියම් ආකස්මික බලවේගයන්ට ගොදුරු වී විපතට පැමිණෙන්නන් සේ දක්වා ඇත. (සරච්චන්ද්‍ර, එදිරිවීර. සිංහබාහු, 2001; 08). සරච්චන්ද්‍රයන් දක්වන්නා වූ මේ අදහස විමැසිය යුතුමය. ඔහු සඳහන් කරන පරිදි මනමේහි චරිතයන්ට සිතා මතා කටයුතු කිරීමට අවකාශයක් එහි දී නොලැබේ. ඒ නිසා සිදු වන්නේ ඔවුන් කිසිසේත්ම අපේක්ෂා නොකළ තත්ත්වයකි.

එය එසේ වු ද සරච්චන්ද්‍ර සූරීන් ම නිර්මාණය කළ 'පෙමතො ජායති සොකො නාට්‍යය තුළ ස්ත්‍රී මානසික ගැටුම නාට්‍යාවසානය දක්වාම දිගහැරේ. ස්වර්ණතිලකාට සිදු වන්නා වූ අකටයුතුකම් හේතුවෙන් ඇයට මානසික ගැටුමක් ඇති වෙයි. උද්දාල බමුණා සමගින් විවාපත් වන අවස්ථාවේ පටන් නොව, ඔහු ඇයව සරණයට පොළඹවන අවස්ථාවේ පටන් ම කාන්තාවක ලෙසින් ඇය ව්‍යාකූල තත්ත්වයකට පත්වන්නී ය. ස්වර්ණතිලකාව කෙසේ හෝ තමන් සතු කර ගැනීමට බමුණා ක්‍රියා කළ ද ඉන් පසුව ඇති වන්නා වූ පල විපාක පිළිබඳව ඔහු අවධානය යොමු නොකළේ ය. අන්තිමේ දී ඇයට සිදු වන්නේ තම සැමියාගෙන් ශිල්ප උගත් තරුණයින්ගෙන් මැරුම් කෑමටයි. ඇයට එම තත්ත්වය උදා වන්නේ පිරිමින්ට රිසි දේ කිරීමට යාමෙනි. ඒ අනුව සරච්චන්ද්‍රයන් ඇය ඉස්මතු කිරීමට උත්සාහ දරන්නේ පුරුෂාධිකාරයෙන් පීඩිත වූ කාන්තාවක ලෙසින්ය.

එහෙත් මනමේ නාට්‍යයේ එවැනි තත්ත්වයක් දැකිය හැකි නොහේ. මනමේහි දී සිදු වන්නේ කුමරියට ස්වාධීන වූ අදහසක් දැරීමට අවස්ථාවක්නොලැබීමයි. යට සඳහන් කළ පරිදි කුමරිය

ස්වාධීන තීරණයක් නොගත්ත ද තමන්ගේ නීත්‍යානුකූල සැමියා කෙරෙහි සාධු සිතින් කටයුතු කළ යුතු ය. ඇය නාට්‍යාරම්භයේ පටන් ම එලෙසින් හැසිරුණා ය. එය එසේ වූව ද නාට්‍යයේ උච්චතම අවස්ථාවේ දී ඇය කළ ප්‍රකාශයෙන් මනමේ කුමරු වික්ෂිප්ත වී යැයි හැඟිය හැකිය.

**බිසව - කවිය**

දිරියෙන් යුද කළ ඔබ සමගින්නේ - සෙනඟින් පිහිට ද නොම සොයමින්නේ

තනියෙන් සටනට සැරසි එමින්නේ - මෙකගින් ඇයි ඔහු ගෙල සිඳලන්නේ

ඇය එම ප්‍රකාශයෙන් නොවතියි.

**කුමරි - වචනය**

මෙ වැදි රජුට තම සෙනඟ සමග එක වරට අප විනාශ කර ලන්ට ඉඩ තිබුණේ නොවේ ද හිමියනි? එහෙත් ඔහු ඔබ සමග තනියම සටන් කළේ ය. ඔහු වනචරයෙකු වූව ද ධෛර්යයෙන් හා උතුම් ගුණයෙන් යුත් කෙනෙකු බව පෙනේ. ඔහු මරා දැමීම නොවටනේ ය හිමියනි. ඔහුට සමාව දෙනු මැනවි.

බිසව මේ අයුරින් පවසන්නට ඇත්තේ ඇය සතුව පවත්නා වූ දූරදර්ශී භාවය නිසා විය හැකිය. තම පිරිසේ සහයක් නොමැතිව කුමරුන් හා යුද කළ වැදි රජු ගේ ධෛර්යය පිළිබඳව ඈ සිතුවාට සැක නැත. එහෙත් ඇතැම් ප්‍රේක්ෂකයෝ මේ අවස්ථාව උපුටා දක්වමින් කාමිනියකට සේ බිසවට පරිභව කළෝ ය. නාට්‍යයේ උච්චම අවස්ථාවේ දී ඇය කෙරෙහි එසේ සිතීම අසාධාරණ නොවේ. මුල් කතාවෙහි නො ව නාටකයෙහි දක්වා තිබෙන අයුරින් නම් බිසව කරන ඉල්ලීම සාධාරණ එකක් ය. තම වැදි සෙනගගේ ආධාරය ද නො පතා තනිව ම වීරයෙකු ලෙස සටන් කළ වැදි රජුට අභය දෙන මෙන් බිසව සිය සැමියාගෙන් අයැද සිටී.(සරච්චන්ද්‍ර, එදිරිවීර. සිංහබාහු, 2001; 08).

මෙවන් තත්ත්වයක් ම සරච්චන්ද්‍රයන්ගේ මළගිය ඇත්තෝ හා ිමළවුන්ගේ අවුරුදු දා නවකතා ද්වයෙන් ද පිළිබිඹු වේ. නොරිකෝගේ චරිතය කෙරෙහි අවධානයෙන් බැලූ කල හැගෙන්නේ  ඇය ද මානසික ගැටුමකින් යුතුව කල් ගෙවූ තැනැත්තියක බවයි. ඈ තම පියාට මෙන් ම සොහොයුරාට ද ප්‍රමුඛත්වය ලබා දී විසුවාය. එහෙත් ඈ තරුණියකට උචිත ගති පැවැතුම්වලින් හොබනී ය. දෙවෙන්දොරා මුණ ගැසීමෙන් පසුව ඒ තත්ත්වය තීව්‍ර විය. නොරිකො නම් තරුණිය ඉතා සුකුමාල හැඟීම් ඇති, සිත් වශී කරන සුලු ගති පැවතුම්වලින් යුත් තැනැත්තියකි. ඈ ස්ත්‍රී වර්ගයාට පොදු අංග ලක්ෂණ වන සුකුමාර භාවයත්, කමනීය ගතියත් කැටි කොට දක්වයි. මේ අංග ලක්ෂණ ඇගේ පරිසරය නිසා වඩාත් ප්‍රකට ව පෙනෙයි.(ඒකනායක. ධර්මසිරි, සාහිත්‍යය හා විචාර කලාව, 2012; 308).

සරච්චන්ද්‍ර මළවුන්ගේ අවුරුදු දා පොතෙහි ලා නොරිකෝගේ චරිතය නිරූපණය කරන්නේ නොපැසුණු හැඟීම් හා අභව්‍ය චෛතසික ධර්මද ඇසුරෙනි. එවැනි අනුචිත උපාය පිවිසීමෙන් එහි රීතිය දුබල වන්නේ ජපන් ගැහැනියක කියන සැටියෙන් ඒ කථාව රචිත නිසායයි සිතමි. මළගිය ඇත්තෝ කථාවෙන් නිරූපණය වන්නේ පවුලේ කුල සිරිත් අනුව ජීවත්වන්ට වෑයම් කරන ජපන් ගැහැනියකගේ ජීවිතයයි. මළවුන්ගේ අවුරුදු දා කතාවෙන් හෙළි වන්නේ ඒ පවුල කුල සිරිත් නොතකා ජීවත්වන්නන් ලෙසිනි.(වික්‍රමසිංහ, මාර්ටින්. සිංහල නවකථාව හා ජපන් කාමකථා හෙවණැල්ල, 1997; 94).

ඉහතින් දැක් වූ වික්‍රමසිංහගේ අදහසින් වැදගත් කරුණක් මතු වේ. කුල සිරිතට අනුව ජීවත්වීමට උත්සාහ කරන්නා වූ ගැහැනියකගේ ස්වභාවයයි. එය එසේ නම් මනමේ නාට්‍යය තුළත් දර්ශනය කරන්නා වූ ස්ත්‍රිය කුල සිරිත් රැකීමට තැත් කරන්නා වූ තැනැත්තියක් වේ.

ආසියානු සංස්කෘතියේ දී කාන්තාව තමන්ගේ කුල සිරිත් රැකීමට ඉමහත් තැතක් දරන්නී ය. මහැදුරු සරච්චන්ද්‍රයන්ගේ බොහෝ නිර්මාණයන්ගෙන් ඒ බැව් ඉස්මතු කෙරේ.

හොඳ සාහිත්‍යකාරයන් හික්මවනු ලබන්නේ මානව භක්තිය හා ප්‍රතිභාවද විසිනි. දයාව, අනුකම්පාව, සියලු මිනිසුන් සහෝදරයන් ලෙස සැලකීම, මතාන්තර උමතුවෙන් තොරවීම හා අසහනයෙන් තොරවීම ද මානව භක්තියෙහි සමහර අංග වෙයි. (වික්‍රමසිංහ, මාර්ටින්. සිංහල විචාර මග, 1992; 153). වික්‍රමසිංහයන්ගේ උක්ත අදහසට අනුව සරච්චන්ද්‍රගේ මානව දෘෂ්ටිය පිළිබඳව ඔහුගේ ම නිර්මාණයන්ගෙන් වටහා ගැනීමට හැකිය. සාහිත්‍යකරුවෙකු ලෙසින් ස්ත්‍රිය පිළිබඳව සරච්චන්ද්‍රයන් හුවා දක්වන්නේ වෙනස්ම දැක්මකි. ඔහු තමන් මූලාශ්‍ර කර ගත් මුල් කෘති අභිභවා යමින් කාන්තාව ද මානුෂීය හැඟීම් ඇත්තියක වසයෙන් දක්වයි. එතැනින් නොනවතින සරච්චන්ද්‍ර ස්ත්‍රීන්ගේ මානසික තත්ත්වයන් ද තම නිර්මාණවලින් නිරූපණය කරයි.

දෘෂ්ටිවාදය වන්නේ පුරුෂමූලික බව නොව ඇය තුළ ඇති ආචාරධාර්මික කුකුස යි. එයිනුත් නොනැවතී ඇය වැදි රජු වෙත තම වසඟය ප්‍රක්ෂේපණය කරයි. එය මනමේ කුමරුට ඇය කළ වසඟයට ම සමාන ය. එහි දී ඇය කියන්නේ වැදි රජ දුටු මොහොතේ පටන් ඇය තුළ මෙම ආපත බෙදුම (spilt in desire) තිබූ බව යි. (ආරියරත්න, මනෝජ්. හපුගොඩ, මහේෂ්. 2019). මේ අදහසින් බිසවගේ චෛතසිකය පිළිබඳව අදහසක් මතු වේ. ඇය තුළ මනමේ කුමරා කෙරෙහි තිබී ඇත්තේ වසඟයක් පමණක් බවයි ඔවුන් සඳහන් කරන්නේ. ඒ වසඟයම වැදි රජුට ද හෙළු බව එහි ම කියයි. බිසවගේ මානසික ගැටුම මනෝවිද්‍යාත්මකව ඉන් ප්‍රකට වේ. එහෙත් ඉන් බිසවගේ ආචාරධර්ම පද්ධතියේ ගැටලුවක් විද්‍යමාන නොවේ.

තමන්ගේ පියාගේ මතයට එරෙහි නොවී ඊට ගරු කරමින් කටයුතු කළ ඇය පසුව ස්වාධීන අදහසක් දැරූ විට ගර්භාවට පාත්‍රවෙයි. නාට්‍යාරම්භයේ දී කුමරිය සඳහන් කළ සුවච බව නිසා ම පියාගේ මතය පරයා යාමට ඇයට නොහැකි වේ. එහෙත් තම පියාට පසු පරම්පරාවක මෙන් ම තමාගේ සමකාලීනයෙකු වන මනමේ කුමරාට තම සිතැඟි පැවසීමට ඈ නොපසුබට වන්නී ය. තමන්ගේ හැඟීම් ඔහු වටහා ගැනීමට සමත් වේ යැයි යන අදහසින් විය යුතුය. එහෙත් ගතානුගතික පුරුෂයෙකු වන කුමරු ඒ කරුණ වටහා නොගනියි. වැදි රජුට අභය ලබා දෙන මෙන් බිසව කළ අයැදුම මනමේ කුමරු වටහා ගැනීම වෙනුවට ඔහු ඒ කෙරෙහි වික්ෂිප්ත වේ. මේ ඉල්ලීම නිසා සැකයට ගොදුරු වූ මනමේ රජු කෙරෙන් තාවකාලික සිහි බුද්ධිය ගිලිහේ. තම බිරිඳගෙන් අචල භක්තියක් අපේක්ෂා කළ ඔහුට ඈ තුළ වෙන පුරුෂයෙකු කෙරෙහි අල්ප මාත්‍රයකදු අනුකම්පාවක් ඇති වීම අවබෝධ කළ හැක්කක් නොවී ය. ඒ වික්ෂිප්ත භාවයෙන් ප්‍රයෝජන ගත් වැදි රජ කඩුව බිසවගේ අතින් ගෙන මනමේ රජු මරයි. (සරච්චන්ද්‍ර. එදිරිවීර, සිංහබාහු, 2001; 8,9).

මනමේ කුමරුගේ සිරුර නාට්‍යයේ දී දක්වා ඇත්තේ මටසිලුටු අයුරිනි. මුල දී ඒ මටසිලුටු බවට ආසක්ත වූ කුමරිය වැදි රජු දුටු විට ඔහු කෙරෙහි ඇදී යයි. මෙවන් අදහසක් ඇතැම්හු ප්‍රකාශ කරති. එහෙත් එය තාර්කිකව (Rationally) බැලූ විට පුහු අදහසක් බව පෙනී යයි.

මුලින් මනමේ සමඟ රාජ්‍යත්වයට ආශා ප්‍රක්ෂේපණයක් කළ ඇය දැන් හිමගිර නොහොත් වැදි රජ ජීවත් වන වනය ඇයගේ උත්කෘෂ්ඨ වස්තුව බවට ප්‍රති-ප්‍රක්ෂේපණය කරයි. එමෙන් ම මටසිලුටු මනමේ කුමරුගේ ශරීරය වෙනුවට රකුසෙකු මෙන් වූ ගොරහැඩි සිරුර වෙත ද ඉහත ආශා ප්‍රක්ෂේපණය ම ප්‍රති -ප්‍රක්ෂේපණය කිරීමට තරම් ඇය වසඟකාරී වේ. (ආරියරත්න, මනෝජ්. හපුගොඩ, මහේෂ්. 2019). මේ ප්‍රකාශයෙන් කුමරිය කාමිනියක බැව් පැවසීමට තැත් කර ඇති සෙයක් පෙනේ. එහෙත් බිසව පිළිබඳව එසේ දැක්වීම සාධාරණ නොවන්නේ ඇයගේ ස්වාධීන මතයට පුරුෂයා මුල සිට ම ඇහුම්කන් නොදුන් බැවිනි. මනමේ කුමරාට තමන්ගේ මනාපය ඇය ප්‍රකාශ කරන්නේ තම පියාගේ මතයට එරෙහිවීමට හැකියාවක් නොතිබුණු බැවිනි. පියා ගේ තීන්දුවක් වශයෙන් ඉදිරිපත් වීම නිසා මෙම විවාහයට විරුද්ධ වීම ගැටලුවකට හේතු වන්නක් ද විය හැකි ය. (ඉන්දික සම්පත්, බිහේෂ්.

මනමේ විමසුම, 2016; 35). එය එසේ වී නම් කුමරියගේ මානසික ගැටුම හට ගෙන ඇත්තේ තම පියාගේ තීන්දුවත් සමගය. එහෙත් ඈ තම සැමියා ඝාතනය කිරීමට සිතන්නියක් නොවූවා ය. ඇය එවන් ආකාරයේ ස්ත්‍රියක නම් තම පියාගේ අණට අකීකරු වන්නීය.

අවසානයේ දී වැදි රජු හා සහවාසයට සූදානම් වන්නේ වනයේ දී ඇයට කිසිදු හව්හරණක් නොලැබෙන බවත් ගොරතර ඉරණමකට මුහුණ දීමට සිදු වන බවත් දන්නා හෙයිනි. එය මානසික ගැටුමක් නොවේ. එහිදී ස්ත්‍රිය සතු ආවේණික ගති ලක්ෂණ පෙන්වූවා පමණි ඇය. අත්තනායක හේරත් ඒ පිළිබඳව සඳහන් කරන්නේ කුමරා මිය ගියේ කුමරියගේ කුමන්ත්‍රණයක් නොවන නිසා බවත් කුමරාගෙන් සිදු වූ දෝෂයක් ලෙසත් ය.

**කුමරි වැදි රජ - තර්ගය**

"මා ප්‍රිය සැමියා මරුමුව වැටුණා - කිම ද කළේ ඔබ මේ අපරාදේ

යහතින් සිටි ඔහු ඔබ ඇන මැරුවා - මේ ඔබ දෝසා - මේ ඔබ දෝසා......."

මනමේ බිසව තම සැමියාගේ වියෝවෙන් පසු වැලපෙන අයුරින් ද ඇයගේ මෘදු බව ඉස්මතු වේ. සිදු වූ දෙයින් ඇය තිගැස්සුණා ය. ඒ අවස්ථාවෙහි ඇයට පිහිට වීමට සිටියේ වැදි රජු පමණි. (සරච්චන්ද්‍ර, එදිරිවීර. මනමේ නාටකය, 2006; 16). මනමේ නාටකය වනාහි මිනිස් චිත්තාභ්‍යන්තරයෙහි පවත්නා සිතිවිලි මනාව නිරූපිත විශිෂ්ට නාට්‍යයකි. දකුණු ආසියානු කාන්තාව නිරන්තරයෙන් මානසික ගැටුම් මධ්‍යයේ දිවි ගෙවන්නියකි. පුරුෂෝත්තමවාදී සමාජයක පීඩාවට පත්වන්නියකි. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර තම බොහෝ සාහිත්‍ය කෘතිවලින් ඉදිරිපත් කරන්නේ ද ඒ තත්ත්වයයි. නොරිකො, සුප්පා දේවිය, ස්වර්ණතිලකා වැන්නියන් අප සමාජයට ප්‍රක්ෂේපණය කරන්නා වූ සමාජීය පීඩනය මානසික ගැටුමක් බවට ඉස්මතු කර පෙන්වන්නී මනමේ බිසවය. මේ තත්ත්වය ආසියානු සමාජයේ එදත් අදත් හෙටත් නොවෙනස්ව පවතින්නක් බව සඳහන් කිරීම යුක්ති යුක්තය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ආරියරත්න, මනෝජ්, හපුගොඩ, මහේෂ් (2019) ආපතික අනුරාගයේ ඉස්මතු වීමඃ මනමේ පිළිබඳ මනෝවිශ්ලේෂණාත්මක විචාරයක්.

ඇන්තනි, ජැක්සන් (1998) එබැවින් බිහිවිය මනමෙ, බොරුල්ල, නිර්මල ප්‍රකාශන.

ඉන්දික සම්පත්, බිහේෂ් (2016) මනමේ විමසුම, කර්තෘ ප්‍රකාශන.

ඒකනායක, ධර්මසිරි (2012) සාහිත්‍යය හා විචාර කලාව, බොරලැස්ගමුව, සංස්කෘතික ප්‍රකාශන.

ගම්ලත්, සුචරිත (1996) මනමේ නාට්‍ය සේවනය, කොළොඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමසිංහ, මාර්ටින් (1997) සිංහල නවකථාව හා ජපන් කාමකථා හෙවණැල්ල, දෙහිවල, සීමාසහිත තිසර ප්‍රකාශකයෝ.

වික්‍රමසිංහ, මාර්ටින් (1992) සිංහල විචාර මග, දෙහිවල, සීමාසහිත තිසර ප්‍රකාශකයෝ.

සරච්චන්ද්‍ර, එදිරිවීර (2006) මනමේ නාටකය, කොළොඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සරච්චන්ද්‍ර, එදිරිවීර (2001) සිංහබාහු, කර්තෘ ප්‍රකාශන.

හේරත්, අත්තනායක එම්. (1991) සිංහබාහු හා මනමේ විවරණය, වරකාපොළ, ආරිය ප්‍රකාශන.